පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
மாகாண கல்வித் திணைக்களம்
மேல் மாகாணம்
Department of Education
Western Province

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
மாகாண கல்விப் பணிப்பாளர்
Provincial Director of Education | 011 2868606

89, ''රන්මහපාය'', කඩුවෙල පාර, බත්තරමුල්ල
89, "ரண்மகபாய" கடுவெல வீதி, பத்தரமுல்ல
89, '' Ranmagapaya '', Kaduwela Road, Battaramulla

දුරකථන පොදු
பொது தொலைபேசி
General Telephone | 011 2875893 0112875895

ෆැක්ස්
தொலைநகல்
Fax | 011 2868606 (P.D E)

ඊ-මේල්
மி -அஞ்சல்
E-mail | pde@edudept.wp.gov.lk

| මගේ අංකය எனது இல My No. | WP/ED/EAD/07/1/වා.ස්.මා - 2024 | ඔබේ අංකය உமது இல Your No. | | දිනය திகதி Date | 2024.08.08 |
|---|---|---|---|---|---|

බස්නාහිර පළාතේ සියලුම
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>බස්නාහිර පළාත තුළ ගුරු සේවයේ ස්ථාන මාරු 2025</u>**

බස්නාහිර පළාතේ සියලුම අධ්‍යාපන කලාපයන්හි ගුරු ස්ථානමාරු සිදුවිය යුත්තේ අධ්‍යාපන ලේකම්ගේ අංක 2007/20 හා 2007.12.13 දිනැති ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුකූලවය.

1.1. එම ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ මූලික කරුණු වන ගුරු සිසු දෙපිරිසගේ ම සුබ සාධනය සැලසෙන පරිදි වාර්ෂික ගුරු ස්ථාන මාරු මෙන් ම අනිවාර්ය ගුරු ස්ථාන මාරු ද ක්‍රියාත්මක කළ යුතු ය. අනිවාර්ය ස්ථාන මාරු යටතේ එකම පාසලේ වසර 10 ට වඩා සේවය කළ ගුරුභවතුන්ගේ ස්ථාන මාරුවීම් ද මේ සමගම ක්‍රියාත්මක කළ යුතුය. තම පාසල්හි වසර 10 ට වඩා සේවය කරන ලද ගුරුභවතුන්ගේ තොරතුරු විදුහල්පති විසින් අදාල කලාප අධ්‍යක්ෂ වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

1.2. පාසලක අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීමට අදාළ ව නිකුත් කර ඇති 06/2021 චක්‍රලේඛය ප්‍රකාරව බස්නාහිර පළාතේ පාසල්වල විෂයානුබද්ධව පවතින ගුරු ඌනතා හා අතිරික්තතා හඳුනාගෙන, අංක 2007/20 දරන ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ සඳහන් කරුණු ද පදනම් කරගෙන, ගුරු අතිරික්තතා හා ඌනතා තුලනය වන සේ ගුරු මාරු මණ්ඩල කටයුතු සිදු කළ යුතු ය. ගුරුවරුන්ගේ සේවය ඌන උපයෝජනය වන සේ අතිරික්තතා ඇති වන ආකාරයට ස්ථාන මාරු සිදු නොකළ යුතු ය.

1.3. කලාපය තුළ ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී, ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියේ 3.4.iv වගන්තිය මගින් පැවරී ඇති බලය ප්‍රකාරව, කලාප ගුරුමාරු මණ්ඩලය විසින් සකස් කර ගන්නා නිර්ණායක ඇතුළත් කාර්ය පටිපාටික සංග්‍රහය ද ගුරුමාරු ප්‍රතිපත්තියේ උපදෙස් හා මගපෙන්වීම්වලට අනුකූල වන පරිදි සකස් විය යුතුය.

1.4. තවද, වර්ෂය පුරා ගුරු සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොවිය යුතු අතර, 2024.11.23 – 2025.01.01 දක්වා පැවැත්වීමට නියමිත අ.පො.ස.(උ.පෙළ) විභාගයේ කටයුතුවලට බාධාවක් නොවන පරිදි අංක ED/09/12/06/05/01-2024 හා 2024.02.29 දිනැති 2024 පාසල් වාර සටහන කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර, ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට අනුගතව සකසන ලද පහත කාල රාමුව තුළ කටයුතු කරන ලෙසත් දන්වමි.

| | කාරණය | දින වකවානු |
|---|---|---|
| 1 | ගුරු මාරුවලට අදාළ තොරතුරු රැස්කිරීම | 2024.09.02ට පෙර |
| 2 | ගුරු මාරු ඉල්ලුම් පත්‍ර කැඳවීම | 2024/08/31ට පෙර |
| 3 | කලාප මාරු මණ්ඩල රැස්වීම | 2024.09.02 සිට 2024.10.30 |
| 4 | මාරු මණ්ඩල නිර්දේශ ලබාදීම | 2024.11.01 සිට 2024.11.22 |
| 5 | මාරුවීම් ලිපි නිකුත් කිරීම/ ස්ථාන මාරු තීරණ අන්තර් ජාලයට යොමු කිරිම | 2025.01.08 ට පෙර |
| 6 | කලාපය තුළ ගුරු මාරු පිළිබඳ අභියාචනා භාරගැනීම | 2025.01.09 සිට 2025.01.24 |
| 7 | අභියාචනා මණ්ඩල තීරණ ලබාදීම / අන්තර් ජාලයට යොමු කිරිම | 2025.02.16 |

**(2024.11.23 සිට 2025.01.01 දක්වා කාල සීමාව තුළ ගුරුභවතුන් අ.පො.ස (උ.පෙළ) විභාගයේ රාජකාරි කටයුතුවල නියැලෙන බැවින් විභාගයට බාධා නොවන පරිදි එම කාල සීමාව හා තෙවන පාසල් වාරයේ පාසල් වාර නිවාඩු කාල සීමාව මඟ හරවා මෙම කාල රාමුව සකස් කර ඇත.)**

## 02. ගුරුමාරුවලට අදාළ තොරතුරු රැස් කිරීම :

සෑම පාසලක් සම්බන්ධයෙන්ම පවත්නා ගුරු අතිරික්ත හා ගුරු ඌනතා තොරතුරු සහ 2024/12/31 දිනට වසර 10 කට වඩා එකම පාසලේ සේවය කළ ගුරුභවතුන්ගේ තොරතුරු ලබා ගත යුතුය. එම තොරතුරු ලබා ගැනීමේදී පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි වැඩිම සේවා කාලයක් සහිත ගුරුභවතුන්ගේ නම් පළමුවත්, ක්‍රමයෙන් සේවා කාලය අඩුවන පිළිවෙලට අනිකුත් අයගේ නම් සඳහන් කරමින් සේවා කාලය අනුව නාම ලේඛනය විදුහල්පතිගෙන් ලබා ගත යුතුය. 2024.09.02 දිනට පෙර මෙම සංඛ්‍යා ලේඛන හා තොරතුරු ලබා ගැනීමේ කටයුතු අවසන් කළ යුතුය.

## 03.ඉල්ලුම්පත් කැඳවීම :

වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඉල්ලුම්පත් කැඳවීම 2024/08/31 දින වන විට අවසන් කළ යුතුය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් දැනුවත් කළ යුතු අතර, නියමිත දිනට පසුව ඉදිරිපත් වන ඉල්ලුම්පත් භාර නොගත යුතුය.

3.1. 3.4 හි දක්වන වර්ගීකරණයට අදාළ ස්ථාන මාරු ඉල්ලීම් සඳහා (WP/ED/EAD/TT -A) ඉල්ලුම් පත්‍රය භාවිත කළ යුතු අතර, කලාපය තුළ වසර 10ට වැඩි ගුරුභවතුන්ගේ ස්ථාන මාරු සඳහා (WP/ED/EAD/TT -B) ඉල්ලුම් පත්‍රය භාවිත කළ යුතුය. *(ඇමුණුම 01 හා ඇමුණුම 02)*

3.2.මේ සමග එවනු ලබන ඉහත 3.1 හි සඳහන් ආකෘති පත්‍ර අනුව සකස් කළ ඉල්ලුම්පත් පමණක් මෙම වර්ෂයේදි භාවිත කළ යුතු අතර, එම ඉල්ලුම්පත්‍රවල පිටපත් සියලුම විදුහල්පතිවරුන් වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.

3.3. 2019/12/31 දිනෙන් පසු පත්වීම් ලැබූ ගුරුභවතුන්ගේ ස්ථාන මාරු ඉල්ලුම්පත් භාර නොගත යුතුය.

3.4. ඉල්ලුම්පත් භාර ගැනීම පහත වර්ගීකරණයන්ට අනුව සිදු කිරීමට කටයුතු කළ යුතු ය.

I. කලාපය තුළ වසර 10ට අඩු ස්ථාන මාරු අයදුම්පත්
II. අන්තර් කලාප ස්ථාන මාරු අයදුම්පත්
III. අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම්පත්
IV. ජාතික පාසල් ස්ථාන මාරු අයදුම්පත්*

*මේ සමග අමුණා ඇති 2024.07.24 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020(1) හි 02 වගන්තියේ දක්වා ඇති අවශ්‍යතා සපුරන පළාත් සභා පාසල්හි ගුරු භවතුන්ට පමණක් ජාතික පාසල් සඳහා ඉල්ලුම් කළ හැකිය. ඔවුන් 2024/12/31 දිනට වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ පළාත් සභා පාසල්හි ගුරු භවතුන් විය යුතුය. ඉල්ලුම් පත්‍රය සමග පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. *(ඇමුණුම 03)*

**04.ඉදිරිපත් කළ යුතු ස්ථාන මාරු පිටපත් ගණන :**

- කලාපය තුළ (01)
- අන්තර් කලාප (01)
- අන්තර් පළාත් (05)
- ජාතික පාසල් (05)

(ඉහත 02 වගන්තියේ සදහන් කොන්දේසි සපුරන ජාතික පාසල් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් 05න් 04ක් කලාපය තුළ රඳවා තබාගෙන, එක් අයදුම්පතක් පමණක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු අතර, එම අයදුම්පත් පළාත් මාරු මණ්ඩලයෙන් නිර්දේශ වුවහොත් පමණක් අදාළ ඉතිරි අයදුම්පත් කලාපයෙන් ගෙන්වා ගැනීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ..)

**05. කලාප මාරු මණ්ඩල රැස්වීම් :**

5.1 ගුරු මාරු අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසාන දිනය වන 2024/08/30 දිනට පෙර කලාප ගුරු මාරු මණ්ඩලය රැස් වී අදාල වසර සඳහා නිර්ණායක සකස් කළ යුතුය. මෙහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ 2024.06.20 දිනැති අංක 2/2024 චක්‍රලේඛය කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. *(ඇමුණුම 04)*

5.2 ගුරු මාරු අයදුම්පත කලාපය වෙත ලැබුණු විගස එහි දින මුද්‍රාව සටහන් කළ යුතුය.

5.3 ලැබී ඇති සියලුම ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් සලකා බලා තීරණ ගැනීම සඳහා කලාප මාරු මණ්ඩලය 2024/09/02 දින සිට 2024/10/30 අතර කාලය තුළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/ නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක (පාලන)ගේ ප්‍රධානත්වයෙන් වරින් වර රැස්විය යුතුය. පසුගිය වසර දෙකේදී ඇතැම් කලාපයන්හි ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි වාර්තාවීම අසතුටුදායක කරුණක් බැවින් මාරු මණ්ඩලයේ නිර්දේශය ඇතිව පමණක් කටයුතු කිරීම අවධාරණය කෙරේ.

**06. ස්ථාන මාරු ඉල්ලුම්පත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යොමු කිරීම :**

6.1 අන්තර් කලාප, අන්තර් පළාත් හා ඉහත 3.4 වගන්තියට අනුගතව ජාතික පාසල් සඳහා ස්ථානමාරු ඉල්ලා සිටින ගුරු භවතුන්ගේ අයදුම්පත් පිළිබඳ තීරණ ගැනීමට කලාප ගුරු මාරු මණ්ඩලය 2024.09.02- 2024.09.30 අතර කාලය තුළ රැස්විය යුතු අතර, එහිදී නිර්දේශ ලබන අන්තර් කලාප, අන්තර් පළාත් හා ජාතික පාසල් අයදුම්පත් 2024/10/10 දිනට පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

6.2 කලාප මාරු මණ්ඩලයේ නිර්දේශ සටහන් කිරීමෙන් තොරව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත එවන අයදුම්පත් පිළිබඳව ඉදිරි කටයුතු සිදු නොකරන බවද දන්වමි.

6.3 සෑම ඉල්ලුම් පත්‍රයකම දකුණු පස උඩ කෙලවරේ රතු තීන්තෙන් **අනු අංකය, වර්ෂය හා කුමන ස්ථාන මාරු වර්ගයකට අයත් ද'** යන්න සටහන් කළ යුතුය.

6.4 අන්තර් පළාත් ස්ථාන මාරු ඉල්ලා සිටින ගුරු භවතුන්ගේ අයදුම්පත්වල **ගුරු භවතාට එරෙහිව විනය පරීක්ෂණ තිබේද, විගණන විමසුම් තිබේද හා සේවය ස්ථිර කර තිබේද යන්න අයදුම්පතේ අදාල ස්ථානයේ පැහැදිලිවම සටහන් කළ යුතුය.**

6.5 සියළුම අයදුම්පත් අනිවාර්යයෙන්ම මේ සමග ඇති ආකෘති 1,2,3 අනුව වෙන වෙනම උපලේඛනගත කර ලිපිගොනු 03 ක් ලෙස ඉදිරිපත් කළ යුතුය.

(වැදගත් : ගුරු භවතා නිදහස් කරන්නේ අනුප්‍රාප්තිකයෙකු සහිතවද, රහිතවද යන්න පමණක් පැහැදිලිව සටහන් කළ යුතුය.)

## 07. ස්ථාන මාරු තීරණ අන්තර්ජාලයට යොමු කිරීම හා ස්ථාන මාරු ලිපි නිකුත් කිරීම :

කලාපය තුළ ස්ථාන මාරු සිදු කිරීමේදී 1.2 වගන්තියෙහි දක්වන පරිදි පාසල්හි ගුරු ඌනතා සමනය වන අයුරින් හා අතිරික්තය තුලනය වන පරිදි කටයුතු කිරීමට වග බලා ගත යුතුය. කලාපය තුළ වාර්ෂික ස්ථානමාරු ලිපි 2025 අධ්‍යයන වර්ෂයේ පළමු වාරයේ පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2025/01/08 දිනට පෙර නිකුත් කළ යුතු අතර ස්ථාන මාරුවීම් .තීරණ අන්තර් ජාලයට යොමු කිරීමටද කටයුතු කළ යුතුය.

## 08. අභියාචනා භාර ගැනීම :

8.1 කලාපය තුළ ස්ථාන මාරු තීරණ සම්බන්ධව සිදුකරන අභියාචනා 2025.01.09 – 2025.01.24 අතර කාලය තුළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

8.2 එම අභියාචනා සලකා බලා තීරණ සහිත ලිපි 2025/02/16 දිනට පෙර නිකුත් කළ යුතුය.

## 09. කලාප ගුරු මාරු තොරතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම :

9.1 සියළුම ගුරු ස්ථාන මාරුවීම් ලිපි නිකුත් කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව වාර්තාවක් ද, ස්ථාන මාරු කිරීමෙන් අනතුරුව ඇතිවී තිබෙන ඌනතා හා අතිරික්තතා පිළිබඳ ලේඛනයක්ද මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම නොපමාව කළ යුතුය.

9.2 ඒ අනුව අතිරික්ත ගුරුභවතුන් කලාපය තුළ ඌණතා පිරවීම සඳහා යොදා ගැනීමට නියමිතය. එසේම වෙනත් පළාත් වලින් බස්නාහිර පළාතට බඳවා ගන්නා ගුරුවරුන්ගෙන් හා නව උපාධි පත්වීම් හා විද්‍යාපීය පත්වීම් මගින් ඌණතා පිරවීමට කටයුතු කරනු ඇත. කෙසේ වෙතත් කලාපය තුළ ගුරු ඌනතා, කලාප ගුරුමාරු මණ්ඩලය සමග සාකච්ඡා කර කලාපය තුළම අතිරික්ත වන ගුරුභවතුන්ගෙන් හැකිතරම් දුරට සපුරා ගැනීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීම වේ.

## 10. අන්තර් පළාත් ගුරුමාරු :

බොහෝ දුෂ්කර ප්‍රදේශවල දිගු කාලයක් සේවය කර බස්නාහිර පළාතේ තම ගම් ප්‍රදේශවල සේවය කිරීමේ අපේක්ෂාවෙන් පැමිණෙන ගුරුවරුන්ට සහන සැලසීම වශයෙන් ඔවුනට වඩා පහසු හා ප්‍රියමනාප පාසල් ලබා දීමද අවශ්‍ය වේ. එම නිසා කලාප තුළ ගුරුභවතුන් ස්ථානගත කිරීමේදී ඒ පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

## 11. එකම පාසලේ වසර 10 ක සේවා කාලයක් ඇති ගුරු භවතුන් මාරු කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු :

(මේ සමඟ ඇති ඇමුණුම 02 හි සඳහන් WP/ED/EAD/TT-B ආකෘතිය අදාළ කර ගත යුතුය.)

11.1 බස්නාහිර පළාතේ සියළුම කලාපයන්හි ගුරු සේවයේ ස්ථාන මාරුවීම් ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට අනුකූලව සිදු කළ යුතුය.

11.2 ගුරුභවතුන් ස්ථානමාරු කිරීමේදී හැකිතාක් දුරට සංස්කෘතිකමය ගැටළු මතු නොවන පරිදි ස්ථාන ගත කිරීමට කටයුතු කළ යුතුය.

11.3 වසර 10 ක සේවා කාලය ගණන් ගැනීමේදී ජනප්‍රිය පාසැල් කීපයක වුවද, සේවා කාලයන් එකතුව වසර 10 ක් ඉක්මවන්නේ නම්, එවැනි ගුරුභවතුන්ද වසර 10 ඉක්මවූ අය ලෙස සැලකේ.

11.4 කිසියම් ගුරු භවතෙකු තම සේවා කාලය තුළදී දුෂ්කර සේවාවන් සිදු නොකර තිබේ නම් එවැනි අය කලාපය තුළ කිසියම් දුෂ්කරතාවයක් ඇති පාසල් වෙත ස්ථාන මාරු කළ යුතුය.

11.5 ආසන්න ජනප්‍රිය පාසල් අතර ගුරු භවතුන් ස්ථාන මාරු නොකළ යුතුය. සුහද මාරු සඳහා ද මෙය අදාල වේ. කලාපය තුළ ජනප්‍රිය පාසල් පොකුරු (පර්ෂද), කොට්ඨාස මට්ටමෙන් හඳුනාගෙන එම පාසල් අතර ස්ථාන මාරු නොකළ යුතුය. කලාප ගුරු මාරු මණ්ඩලය විසින්

හඳුනාගන්නා ලද එම ජනප්‍රිය පාසල් පොකුරු (පර්ෂද), පිළබඳව ලේඛනයක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නොපමාව ලබා දිය යුතුය. නමුත් උසස් පෙළ විද්‍යා විෂයයන්, තාක්ෂණ විෂයයන් හා උසස් පෙළ ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා මෙම සීමා කිරීම අදාළ නොවේ.

11.6 මීගමුව, මතුගම, කොළඹ කලාපයන්හි සේවය කරන, එහෙත් පිටස්තර කලාපයන්හි හෝ පළාත්වල ස්ථිර පදිංචිකරුවන් වන ගුරුභවතුන් 2025 වසර සඳහා අන්තර් කලාප හෝ අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇත්නම් ඔවුන් 2024/12/31 දිනට අදාල පාසලේ වසර 10 ක කාල සීමාවක් සේවය කර ඇති වුවද කලාපය තුළ ස්ථානමාරු වීම් වලට ලක් නොකළ යුතුය. එසේම ඉහත කලාප තුන හැරුණු විට අනෙකුත් කලාපවල සිට අන්තර් පළාත් ගුරු මාරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති ගුරුභවතුන් 2024.12.31 දිනට එකම පාසලේ වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වුවද, ඔවුන්ගේ ස්ථාන මාරුවලට පළාත් ගුරු මාරු මණ්ඩලයේ නිර්දේශ ලැබී ඇත්නම් ඔවුන් ද කලාපය තුළ ස්ථාන මාරුවීම්වලට ලක් නොකළ යුතුය. එසේ පළාත් ගුරු මාරු මණ්ඩලයේ නිර්දේශය ලබා ඇති අන්තර් පළාත් ගුරු මාරුවීම් ඉල්ලුම් කළ ගුරු භවතුන්ගේ නාම ලේඛනයක් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලබා දෙනු ඇත. එසේම එකම පාසලේ වසර 11 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සහිත අන්තර් කලාප ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරුභවතුන්ට මෙම සහනය හිමි නොවේ.

11.7 2024 වසර පළමු ශ්‍රේණිය සහ තුන්වන ශ්‍රේණිය සඳහා ඉගැන්වීම්හි නිරත ගුරු භවතුන් වසර 10 ක සේවා කාලයක් ඉක්මවා ඇතත් ස්ථාන මාරු වීම් වලට ලක් නොකළ යුතුය. ආසන්න වසර දෙකක කාලය තුළ එක් වසරකදී 1 හෝ 3 ශ්‍රේණි සඳහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරු භවතුන් සඳහා පමණක් මෙසේ ස්ථාන මාරුවීම් ලබා නොදී තැබිය හැකිය. එසේ වුවද 2023 වසරේ 1 හා 3 ශ්‍රේණි සඳහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරු භවතුන් 2024/12/31 දිනට වසර 10 සම්පූර්ණ වී ඇත්නම් දස අවුරුදු ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ස්ථාන මාරුවීම්වලට ලක් නොකරන ගුරු භවතුන්ගේ නාම ලේඛනයක් කලාප ගුරු මාරු මණ්ඩලය විසින් පිළියෙල කළ යුතු ය. 2026 වසරේ පළමු අධ්‍යයන වාරය ආරම්භ වන දින සිට එම ගුරු භවතුන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතුය.

11.8 ප්‍රවාහන අපහසුතා, හුදකලාව පිහිටීම, භූගෝලීය අපහසුතා, අඩු ඉල්ලුමක් සහිත විම, භෞතික සම්පත්වල ස්වභාවයන් ආදී නිර්ණායක පදනම් කරගනිමින් කලාප ගුරු මාරු මණ්ඩලය විසින් කලාපය තුළ දුෂ්කර පාසල් හඳුනාගෙන ලේඛනයක් සැකසිය යුතු අතර, එම ලේඛනයේ පිටපතක් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

11.9 එලෙස හඳුනාගත් දුෂ්කර පාසලක වසර 10ක සේවා කාලයක් සපුරා ඇති ගුරු භවතෙකු වෙනත් පාසලකට ස්ථාන මාරු කළ යුත්තේ එම ගුරුභවතා ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් පමණි. එසේ වුවද, එලෙස වසර 10ක් සම්පූර්ණ කළ දුෂ්කර පාසලක ගුරු භවතෙකුගේ අදාළ විෂය සඳහා වෙනත් පාසලක ගුරු භවතෙකු ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් වසර 10ක සේවා කාලයක් සහිත එම ගුරු භවතාව ස්ථාන මාරුවකට ලක්කළ යුතුය. එවැනි අවස්ථාවන්හිදී දුෂ්කර පාසලේ සේවය කරන එම ගුරු භවතා ඉල්ලා සිටින පාසලක් ම ලබා දීමට උත්සහ කළ යුතුය. වසර 10ක් සම්පූර්ණ වීම මත ස්ථාන මාරු ලබන එවැනි දුෂ්කර පාසලක සේවය කළ ගුරු භවතෙකුට වෙනත් පාසලක වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු නැවත පෙර සේවය කළ පාසලට ම විධිමත් ලෙස ස්ථාන මාරුවීමක් ලබා පැමිණිය හැකිය.

11.10 වසර 10 ක ස්ථාන මාරුවලට ලක්වූ ගුරුවරයෙකු නැවත වසර 05 ක් යනතුරු කුමන හේතුවක් මත හෝ පෙර සේවය කළ පාසලට ස්ථානමාරු කිරීම හෝ අනුයුක්ත කිරීම නොකළ යුතුය. එසේ වුවද කලාප ගුරු මාරු මණ්ඩලය විසින් හඳුනාගත් දුෂ්කර පාසලක සේවයට නැවත පැමිණීමට මෙය අදාළ නොවේ.

11.11 අදාළ ගුරු භවතාගේ /කලත්‍රයාගේ / දරුවන්ගේ පෙනෙන ආබාධිත තත්වයන්, සුවිශේෂී වූ රෝගී තත්වයන් හා දිගු කාලීන වෛද්‍ය සායන සටහන් පිළිබඳව මාරු මණ්ඩලය සෑහීමකට පත්වන අවස්ථාවකදී එවැනි ගුරු භවතුන් හට සහනදායී ලෙස ස්ථාන මාරු මණ්ඩල තීරණ ක්‍රියාත්මක කළ හැකිය. එලෙස ලබා දෙන ස්ථාන මාරු තීරණය පිළිබඳ අභියාචනා ඉදිරිපත් කරන

අවස්ථාවලදී එය අභියාචනා මණ්ඩලයක් වෙත යොමු කිරීමට කටයුතු කර තීරණ ලබා දිය යුතුය.

11.12 ගර්භනී අවස්ථාවේ පසුවන ගුරු මහත්මීන් සහ 2025/02/15 දින වන විට වයස අවුරුදු 01 ට අඩු දරුවන් සිටින ගුරු මහත්මීන් සඳහා ස්ථාන මාරු ලබා දිය යුත්තේ ඔවුන් ඉල්ලා සිටින්නේ නම් පමණි.(මෙය අදාළ ලේඛන මගින් සනාථ කර ගත යුතුය.)

11.13 2024/12/31 දිනට වයස අවු.55 ක් සම්පූර්ණ කළ හෝ අවු.55 ඉක්මවූ ගුරු භවතුන්ට ඔවුන්ගේ ලිඛිත කැමැත්තකින් තොරව ස්ථාන මාරු ලබා නොදිය යුතුය. එසේ වුවද විශ්‍රාම ගැන්වීමේ වයස පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සංශෝධනයක් සිදු කරන අවස්ථාවකදී මේ පිළිබඳව ඉදිරියේදී දැනුවත් කෙරෙනු ඇත. පෙර වසර වලදී දස අවුරුදු සේවා කාලය සපුරා තිබිය දී හා වයස අවුරුදු 55 ආසන්නව තිබිය දී නොයෙක් හේතුන් මත ස්ථාන මාරු නොකළ ගුරු භවතුන් සිටිනම් මේ වන විට වයස අවුරුදු 55 සම්පූර්ණ වී ඇතත් එම ගුරු භවතුන් හට ස්ථාන මාරු ලබා දීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් කලාප ගුරු මාරු මණ්ඩලය විසින් සකස් කළ යුතුය.

11.14 මෙයට පෙර දස අවුරුදු ස්ථාන මාරු ලද ගුරු භවතෙකු නැවත දස අවුරුදු ස්ථාන මාරුවකට ලක්වීමේදී අදාල දස අවුරුදු කාල සීමාව ගණනය කරනු ලබන්නේ ස්ථාන මාරු ලද පාසලේ වැඩ භාරගත් දිනය පදනම් කරගෙන නොව එම ගුරු භවතා ස්ථාන මාරුවට ලක් කරන ලද ලිපියේ දිනය පදනම් කරගෙන වේ.

12. ඉහත සඳහන් කර ඇති ඇමුණුම් 01,02,03 හා 04 ට අමතරව ගුරු ස්ථාන මාරු ක්‍රමවේදය කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීම සඳහා පහත ඇමුණුම්ද ඉදිරිපත් කරනු ලැබේ.

I. ඇමුණුම 05 - පිරික්සුම් ලැයිස්තුව අන්තර් පළාත්

II. ඇමුණුම 06 - පිරික්සුම් ලැයිස්තුව ජාතික පාසල්

III. ඇමුණුම 07 – WPC/PSC/R/FO/02 ණය ශේෂ නිරවුල් කිරීමේ සහතිකය

IV. ඇමුණුම 08 - අංක 10 පරිශිෂ්ටය

D.A. N. Perera

ඩබ්.ඒ.නීලිකා පෙරේරා
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(වැ.බ)
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත.

ඩබ්. ඒ. නීලිකා පෙරේරා
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (වැ.බ.)
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
"රජමගපාය" බත්තරමුල්ල.

පිටපත් :-

01.ලේකම් - රා.සේ.කො (බ.ප)

02.පළාත් අධ්‍යාපන ලේකම් (බ.ප)

03.අධ්‍යාපන වෘත්තීය සමිති ප්‍රධාන ලේකම්වරුන් - ගුරුමාරු මණ්ඩල නියෝජිතයන් නම් කිරීම පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2024.06.20 දිනැති අංක 2/2024 චක්‍රලේඛය අනුව කටයුතු කරමින් වෘත්තීය සමිති ලේකම්වරුන් විසින් තම ගුරුමාරු මණ්ඩල නියෝජිතයින් නම් කිරීම සඳහා හා 2024/2025 වර්ෂය සඳහා මාරු මණ්ඩල නියෝජිතයින්ගේ නාම ලේඛන (පළාත් සහ කලාප) 2024/08/31 දිනට පෙර පළාත් අධ්‍යාපන ලේකම් වෙත ලබා දීම සඳහා